(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 75.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 මැයි 18 අඟහරුවාදා පූ.භා. 10.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

39/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආයතන සංග්‍රහයේ xxii පරිච්ඡේදයේ —

(i) 18:2:1 උප වගන්තියට අනුව රාජ්‍ය සේවයේ නියුතු නිලධාරිනියකට සෑම සජීවී දරු උපතක් සඳහාම රජයේ වැඩ කරන දින 84ක සම්පූර්ණ වැටුප් සහිත නිවාඩුවක් හිමි විය යුතු බවත්;

(ii) 18:3:1 උප වගන්තියට අනුව දරුවා රැක බලා ගැනිමට දින 84ක අඩ වැටුප් සහිත නිවාඩුවක් හිමි විය යුතු බවත්;

(iii) 18:4:1 උප වගන්තියට අනුව අවශ්‍ය නම්, තවත් දින 84ක වැටුප් රහිත නිවාඩුවක් ලබා දිය හැකි බවත්;

(iv) ඉහත (i) යටතේ නිවාඩු ගණන් බැලීමේදී නිවාඩු කාලය තුළ ඇති සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු ඇතුළත් නොකළ යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ වුවද, එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද උපාධිධාරී පුහුණු වැඩසටහන යටතේ බඳවා ගත් නිලධාරිනියන්ට ලබා දී ඇති පත්වීම් ලිපි අනුව ඔවුන්ට ලබා දෙනු ලබන්නේ සති 06ක ප්‍රසූත නිවාඩුවක් බව පිළිගන්නේද;

(ii) ඔවුන්ට ආයතන සංග්‍රහය අනුව හිමිවිය යුතු ප්‍රසූත නිවාඩු ලබා දීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

141/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් ඌව පළාත් සභාව සම්බන්ධයෙන් සිදු කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති විගණන නිර්දේශ කවරේද;

(iv) එම විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගනු ලබන පියවර කවරේද;

(v) මූල්‍ය අක්‍රමිකතා හා මූල්‍ය අවභාවිතා කිරීම් සම්බන්ධ දේශපාලන අධිකාරිත්වයට හා නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

236/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ පොල් තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම පොල් තෙල් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම පොල් තෙල් ආනයනය කළ සමාගම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට පොල් තෙල් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

265/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රත්මලානේ පිහිටි ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය ප්‍රමාණවත් නොවන බවත්;

(ii) මෙම හේතුව කාර්යක්ෂම දුම්රිය සේවයක් ස්ථාපිත කිරීමට බාධාවක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රත්මලාන ප්‍රධාන නඩත්තු වැඩපළෙහි ධාරිතාවය වැඩි කිරීමට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීමට හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, මිලදී ගැනීමට අපේක්ෂිත යන්ත්‍ර සූත්‍ර කවරේද;

(iii) එම යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

560/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට රජය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානය තුළ මේ වනවිට ගබඩා කර තිබෙන වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගබඩාවලට අමතරව නව වී ගබඩා මධ්‍යස්ථාන ආරම්භ කිරීමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ගොවීන් සඳහා නොමිලේ පොහොර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් ගොවියෙකු සඳහා ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එසේ නොමිලේ ලබා දෙන පොහොර වර්ග කවරේද;

(iv) ඒ සඳහා රජය විසින් වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

600/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය ඩෙල්ෆ් දූපතේ ඇති ප්‍රධාන ප්‍රවාහන මාර්ගය වන මාවිලිත්තුරෙයි සිට සාරාපිටි හරහා කෝට්ටෙයිකාඩු දක්වා වූ කිලෝමීටර 08ක දුර ප්‍රමාණයකින් යුත් ඩෙල්ෆ් ප්‍රධාන මාර්ගය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

(ii) දැඩි අබලන් තත්ත්වයේ පවතින මෙම ප්‍රධාන මාර්ගය ශිෂ්‍යයන්, නිලධාරීන්, වයෝවෘද්ධ තැනැත්තන් හා ගැබිනි මාතාවන්ද භාවිතා කරනු ලබන අතර ගිලන් රථද මෙම මාර්ගයේ ගමන් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ප්‍රධාන මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතු කවරේද;

(ii) මෙම මාර්ගය සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

610/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) කුලියාපිටිය මූලික රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ සායනික පුහුණුවීම් සඳහා යොදාගැනීමට කටයුතු කරන්නේද;

(ii) මේ සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා කුලියාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධව මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(ii) එම ඒකකය කුලියාපිටිය රෝහලේ ස්ථාපනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

633/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති දික්කෝඩෙයි රෝහල ජනතා අවශ්‍යතා සඳහා භාවිතා කළ නොහැකි මට්ටමක පවතින බවත්;

(ii) මේ හේතුවෙන් එම රෝහලෙන් සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන් විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහලෙන් දෛනිකව සේවා ලබා ගන්නා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත රෝහලෙහි පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීමට කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

642/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) උතුරු මැද පළාතේ පිහිටි පහළ මල්වතුඔය ජලාශය ඉදිකිරීම සඳහා හිටපු අග්‍රාමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, චීන සමාගම යන ආයතන දෙක අතරින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු චීන සමාගම විසින් සිදු කරනු ලබන්නේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

734/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති තැපැල් දෙපාර්තමේන්තුව සතු තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම තැපැල් කාර්යාලවල සේවය කරනු ලබන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත තැපැල් කාර්යාල අතරින් කුලී පදනම මත ලබා ගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(iv) එම තැපැල් කාර්යාල සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිරිකිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ රෙගුලාසි,— 2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/59 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය,— 2006 අංක 11 දරන මුදල් පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 6(2) වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 09 දිනැති අංක 2214/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියෝගය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 05 දිනැති අංක 2209/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.04.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 21 දිනැති අංක 2202/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 14 දිනැති අංක 2206/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 16 දිනැති අංක 2206/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 13 දිනැති අංක 2210/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජනවාරි 18 දිනැති අංක 2211/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 පෙබරවාරි 11 දිනැති අංක 2214/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මාර්තු 03 දිනැති අංක 2217/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වගන්තිය යටතේ සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 05 දිනැති අංක 2217/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වගන්තිය යටතේ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2021 මාර්තු 23 දිනැති අංක 2220/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— විදේශ විනිමය පනත යටතේ නියෝග,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2021 අප්‍රේල් 07 දිනැති අංක 2222/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.05.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 23 දිනැති අංක 2207/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.03.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*18.

අධිකරණ අමාත්‍යතුමා,— අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි II කොටසේ 10(1) වගන්තිය මඟින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත පැවරී ඇති බලතල හා කාර්යයන් ඉටු කරලීම පිණිස උක්ත පනතේ 4(1) හා 6 වගන්ති ප්‍රකාරව සාමාජිකයන් 07 දෙනෙකු පත් කර ඇති අතර ඉන් එක් සාමාජිකයෙකු එම කාර්යාලයේ සභාපතිවරයා වශයෙන් පත් කර ඇති හෙයින් ද;

එම නිලධාරින් හට 2016 අංක 14 දරන පනතේ 20 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන වැටුපක් ගෙවීමට හා එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බවට සඳහන් වී ඇති හෙයින් ද;

අංක 18/0689/705/001 හා 2018.06.05 දිනැති සංශෝධිත අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ලබා දුන් අනුමතිය හා 2018.09.04 දිනැතිව පාර්ලිමේන්තුවේ සම්මත වූ යෝජනාව අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට රු.100,000/-ක මාසිකව දීමනාවක්ද, රු.10,000/-ක මාසික දුරකථන දීමනාවක් ද, මාසිකව ඉන්ධන ලීටර් 225ක් ද, එම කාර්යාලයේ සාමාජියන් හට රු.75,000/- ක මාසික දීමනාවක් ද, රු.8,000/-ක මාසික දුරකථන දීමනාවක් ද හා නිවසේ සිට කාර්යාලය වෙත ඇති දුර ප්‍රමාණය මත පදනම්ව කි.මී.350ක සීමාවක් දක්වා රු.25,000/- හෝ කි.මී.350ක් හෝ ඊට වැඩි දුර ප්‍රමාණයක් සඳහා රු.50,000/-ක ප්‍රවාහන දීමනාවක් ද සඳහා හිමිකම් ලබන හෙයින් ද;

අධිකරණ අමාත්‍යාංශය යටතේ ඇති හානි පූර්ණ කාර්යාලයේ සාමාජිකයන් සඳහා වැටුප් තීරණය කරනු ලබන්නේ ද පාර්ලිමේන්තුව විසින් වන අතර 2019.09.20 දිනැතිව සම්මත කරන ලද යෝජනාව අනුව එම නිලධාරීන්ගේ වැටුප් සංශෝධනය කර ඉහළ අගයක් ලබා දී ඇති හෙයින් ද;

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජියන් හට ද 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව 2020.11.30 දින සිට වේතන හා දීමනා පහත පරිදි ගෙවීමට තීරණය කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අංක අමප/21/0362/330/022 හා 2021.03.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමතිය ලබා දී ඇති හෙයින් ද:—

(අ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.100,000/- සිට රු.135,000/- දක්වා වැඩි කිරීම;

(ආ) සභාපතිවරයාගේ භාවිතය සඳහා නිල වාහනයක් ලබා නොදෙන අවස්ථාවල අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ සඳහන් වන පරිදි සභාපතිවරයාගේ පෞද්ගලික වාහනය රාජකාරි සඳහා භාවිතා කිරීම වෙනුවෙන් රු.50,000/-ක මාසික දීමනාවක් ලබා දීම; සහ

(ඇ) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සාමාජිකයන් හට මාසික දීමනාව, දැනට ලබා දෙන ඉන්ධන හා දුරකථන දීමනාවට අමතරව රු.75,000/- සිට රු.90,000/- දක්වා වැඩිකර ගෙවීම.

ඊට අනුකූලව, 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතෙහි 20 වගන්තිය ප්‍රකාරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ඇතුළු සාමාජිකයන් හට රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප් හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

*19.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

*20.

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

***** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**